(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 129.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 ඔක්තෝබර් මස 19 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0656/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රටෙහි තිබෙන විශාලතම රජයේ දෙපාර්තමේන්තු දහය කවරේද;

(ii) ඒවා විශාලතම දෙපාර්තමේන්තු දහය අතරට ගැනෙන ලෙස සලකන්නේ කෙසේද;

(iii) එම එක් එක් ආයතනයට යොදවා ඇති ප්‍රාග්ධන ප්‍රමාණය සහ ඒවායේ දැනට සිටින සේවක සංඛ්‍යාව කවරේද;

(iv) මෙම එක් එක් දෙපාර්තමේන්තුව අද දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ ලැබූ ලාභය හෝ පාඩුව වාර්ෂික පදනමින් කොපමණද; සහ

(v) එම එක් එක් දෙපාර්තමේන්තුවේ වෙළෙඳපොළ කොටස කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත දෙපාර්තමේන්තු අතරින් පාඩු ලබන ආයතන ලාභ ලබන ආයතන බවට පත් කළ හැකිද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0931/'10

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) දකුණු පළාතේ පාසල්වල මේ වන විට වර්ෂ 10 කට ආසන්න කාලයක් ස්වේච්ඡා පදනම මත සේවයේ නියුක්ත ගුරු පිරිසක් කිසිදු දීමනාවක් නොලබා සේවය කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එලෙස සේවය කරනු ලබන ගුරුවරුන්ගේ නම් සහ සංඛ්‍යාව අධ්‍යාපන කලාප මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ගුරුවරුන් බඳවාගනු ලැබුවේ කවර විෂයයන් ඉගැන්වීම සඳහාද;

(iii) ඔවුන් බඳවාගත් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දිවයිනේ වෙනත් පළාත්වල සේවය කරන ලද ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, දකුණු පළාතේ ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1040/'10

3.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ දුප්පත්කම තුරන් කිරීම වෙනුවෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ක්‍රියාමාර්ග හරහා ආවරණය වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) දුප්පත්කම තුරන් කිරීමේ ඉලක්ක වර්තමාන රජයේ වැඩසටහන් තුළින් සාර්ථකව සපුරාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1091/'11

4.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාසිකව රුපියල් 1000 ට අඩු සමෘද්ධි සහනාධාරය ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) 2010 වර්ෂයේදී සමෘද්ධි සහනාධාරය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) 2011 වර්ෂයේදී සමෘද්ධි සහනාධාරය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මහින්ද චින්තනයේ සඳහන් පරිදි,

(i) රුපියල් 1000 ට වඩා අඩුවෙන් සමෘද්ධි සහනාධාර ලබන සෑම පවුලකම සමෘද්ධි දීමනාව රුපියල් 1000 දක්වා වැඩි කර තිබේද;

(ii) අවුරුදු 3ට අඩු දරුවන් සිටින සෑම පවුලකම දරුවන් වෙනුවෙන් රුපියල් 1500ක අතිරේක සහනාධාරයක් ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) සෑම සමෘද්ධි පවුල් ඒකකයකටම යම් ව්‍යාපාරයක් කරගෙන යාමට හෝ වෘත්තියක නියැලීමට අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දීම සඳහා රුපියල් 100,000 දක්වා ණය මුදලක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1248/'11

5.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1432/'11

6.
ගරු අජිත් කුමාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0657/'10

7.
ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රට තුළ ඇති රජයට අයත් විශාලතම ව්‍යාපාර 30 කවරේද;

(ii) ඒවා රජය සතු විශාලතම ව්‍යාපාර 30 ලෙස සලකනු ලබන්නේ කවර පදනමකින්ද;

(iii) එක් එක් ආයතනයෙහි ආයෝජනය කරන ලද මූලධන ප්‍රමාණය හා දැනට සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) මේ දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් ආයතනයෙහි ලාභ හෝ පාඩු වාර්ෂික පදනමින් කොපමණද;

(v) රජය සතු, එක් එක් ව්‍යාපාරයෙහි වෙළෙඳපොළ කොටස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපාර අතරින් පාඩු ලබන සෑම ආයතනයක්ම ලාභ ලබන තත්ත්වයට පත් කළ හැකිද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1250/'11

8.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1274/'11

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි කුඹුරු අක්කර එකසිය පනහකට පමණ ජලය සපයන වේකෙවිල අමුණ නිසි පරිදි නඩත්තු නොකරන බවත්;

(ii) එම හේතුවෙන් තම වගා කටයුතු සඳහා අවශ්‍ය ජලය සපයා ගැනීමට නොහැකිව එම ප්‍රදේශයේ ගොවීන් දැඩි අපහසුතාවට පත්ව සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වේකෙවිල අමුණ කඩිනමින් ප්‍රතිසංස්කරණය කොට ගොවීන්ගේ ජල අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1316/'11

10.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ හිල්ටන් හෝටලය රජයට පවරා ගනු ලැබූ දිනය කවදාද;

(ii) එය රජයට පවරා ගැනීමට හේතුවූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය නැවත එම එම හෝටලය විකිණීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා තීරණය කර ඇති වටිනාකම කොපමණද;

(iii) එය මිලදී ගනු ලබන පුද්ගලයා හෝ ආයතනය කවරේද;

(iv) එම ගනුදෙනුව සිදුකරනු ලබන්නේ බදු පදනම යටතේද; නැතහොත් ස්ථිර පදනම යටතේද;

(v) එම මිලදීගැනීම බලපවත්නා කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1433/'11

11.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0687/'10

12.

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රටේ සමස්ත විදුලිබල උත්පාදනය සහ එම ප්‍රමාණයෙන් ජල විදුලිබල හා තාප විදුලිබල උත්පාදන ප්‍රතිශතයන් කවරේද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලය සහ පුද්ගලික අංශය විසින් උත්පාදනය කරනු ලබන තාප විදුලිබල ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ක්‍රමක්ෂය, පොළී ගෙවීම් සහ ණය ආපසු ගෙවීම් ඇතුළුව ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි නිෂ්පාදන පිරිවැය කවරේද;

(ii) උත්පාදනය කරනු ලබන තාප විදුලිබල ඒකකයක මිල සහ පුද්ගලික අංශය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට එම මිලට තාප විදුලිබලය සැපයීම සඳහා ගිවිසුම් ගත කාල සීමාව කවරේද;

(iii) තාප විදුලිබලය මිලදී ගැනීමට අදාළ ගිවිසුම්වල ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් කිසියම් වගන්තියක් තිබේද;

(iv) සූර්ය බලය හා සුළං බලය පදනම් කරගෙන විදුලිය උත්පාදනය කිරීමට සම්බන්ධ කිසියම් සංවර්ධන වැඩසටහනක් තිබේද;

(v) එවැන්නක් නොමැති නම්, එකී පුනර්ජනනීය ශක්ති ප්‍රභව විදුලිය උත්පාදනය සඳහා භාවිතා නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය අංශය විසින් උත්පාදනය කිරීමේදී;

(ii) පුද්ගලික අංශයෙන් මිලදී ගැනීමේදී;

(iii) ව්‍යාපාරික අංශයට සහ ගෘහස්ත පාරිභෝගිකයන්ට විකිණීමේදී;

විදුලි ඒකකයක සාමාන්‍ය මිල කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1301/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල හා බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාස දෙකට යාබදව නළගම, විල්ලද්දර නම් වූ ප්‍රදේශයේ වර්ෂ දෙදහසක් තරම් පැරණි නාමයාල විල පිහිටා ඇති බවත්;

(ii) 2005 වර්ෂයේදී මෙම විල සහ අවට ඉඩම් පානීය ජල ව්‍යාපෘතියක් සඳහා රජයට පවරා ගත් බවත්;

(iii) එම ස්ථානයේ තංගල්ල, බෙලිඅත්ත ඒකාබද්ධ ජල යෝජනා ක්‍රමය නමින් ජල ව්‍යාපෘතියක් සඳහා 2005.10.05 දින මුල්ගල් තැබුවද, මේ දක්වා එහි ඉදිකිරීම් කටයුතු සිදු නොවී පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල ව්‍යාපෘතිය මගින් ජලය සැපයීමට සැලසුම් කර තිබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එහි වැඩකටයුතු කඩිනමින් ආරම්භකොට ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එහි වැඩ ආරම්භ කරන දිනය කවරේද;

(iv) ඊට වැයවන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ජල යෝජනා ක්‍රමය නිසා ඉඩම් අහිමි වූ ජනතාවට ඉඩම් ලබා දීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකසන්නේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1317/'11

14\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය දැනට පවත්වාගෙන යනු ලබන ස්ථානය කවරේද;

(ii) එම ස්ථානය ස්ථිර හෝ බදු හෝ කුලී පදනම මත ලබාගෙන තිබේද;

(iii) කුලී පදනම මත ලබාගෙන ඇත්නම්, ඒ සඳහා මාසිකව ගෙවනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙනත් ස්ථානයක් වෙත රැගෙන යාමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම නව ස්ථානය කුමක්ද;

(iii) එම ස්ථානය බදු හෝ කුලී පදනම යටතේ ලබාගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා මාසිකව ගෙවිය යුතු මුදල කොපමණද;

(v) බදු හෝ කුලී පදනම මත එම ස්ථානය ලබා ගෙන ඇති කාල සීමාව කොපමණද;

(vi) එම ගොඩනැගිල්ලේ හිමිකරු කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1434/'11

15\.

ගරු අජිත් කුමාර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම් එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ප්‍රජා ඖෂධවේදීන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

3.

ගරු රුවන් රණතුංග මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රොෂාන් රණසිංහ ජනසහන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

4.

ගරු තිලංග සුමතිපාල මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මෙත් සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු තිලංග සුමතිපාල මහතා මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 4),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සිත් සෙවන මන්ද මානසික ළමා සංවර්ධන සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියෝගය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, (52 වැනි අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 22(1) (අ) වැනි වගන්තිය යටතේ, ස්වභාවය වෙනස් නොකරන ලද නොහොත් පානීය, විකිණීම සඳහා බෝතල් ගතකරන ලද මත්පැන් අපනයනය කිරීම සඳහා අවසර දීම සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් පනවන ලදුව, 2011 ජුනි 21 දිනැති අංක 1711/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.10.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අංක 937 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියෝගය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, (52 වැනි අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 22(1) වැනි වගන්තිය යටතේ, දේශීය ඖෂධ නිෂ්පාදනය හා වෙනත් අනුමත කර්මාන්ත හා කාර්යයන් සඳහා යොදා ගනු ලබන ඊතයිල් මධ්‍යසාර මත බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් පනවන ලදුව, 2011 ජුනි 21 දිනැති අංක 1711/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.10.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අංක 938 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජූලි 11 දිනැති අංක 1714/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජූලි 11 දිනැති අංක 1714/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 3),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 අගෝස්තු 12 දිනැති අංක 1718/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 4),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 අගෝස්තු 12 දිනැති අංක 1718/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ගොවිජන සංවර්ධන (සංශෝධන)පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*14.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*15.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*20.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*21.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*22.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*23.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*24.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— “2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.”

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

27.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

28.

බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

29.

ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

30.

රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

31.

දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**